# පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
## කැලණිය විශ්වවිද්‍යාලය

# වාර්ෂික වාර්තාව 2017

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය
අංක 407, බෞද්ධාලෝක මාවත, කොළඹ 07

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 1. | හැඳින්වීම | 1 |
| 2. | දැක්ම | 2 |
| 3. | මෙහෙවර | 2 |
| 4. | සහයෝගීතා අපේක්ෂාව | 2 |
| 5. | කළමනාකරන මණ්ඩලය | 3 |
| 6. | අධ්‍යක්ෂවරයාගේ කාර්ය සමාලෝචනය | 4 |
| 7. | ආයතනික සංවිධාන ව්‍යුහය | 6 |
| 8. | සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර | 7 |
| | 8.1 උපාධි නොවන පාඨමාලා | 7 |
| 9. | දේශීය ශිෂයයන් පිලිබඳ විස්තර 2017/2018 | 8 |
| 10 | .අධ්‍යයන කාර්ය මණ්ඩලය | 8 |
| 11. | පරිපාලනය සහ මුදල් කාර්ය මණ්ඩලය | 9 |
| 12. | අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය | 9 |
| 13. | අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 10 |
| 14 | පර්යේෂණ විස්තරය හා නවෝත්පාදන සහ ප්‍රකාශන | 11 |
| 15. | වැඩසටහන් විස්තර සම්මේලන සහ වැඩමුළු | 11 |
| 16. | ලබාගත් සම්මාන පිළිබඳ විස්තර | 11 |
| 17. | පර්යේෂණ කාර්යයන් | |
| | අ) අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලය | 12 |
| | ආ) පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන සේවක මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබූ වැඩමුළු හා ක්ෂේත්‍ර වැඩසටහන් | 15 |
| | ඇ) 2017 වර්ෂයේ දී ලැබූ ජාතික හා ජාත්‍යන්තර සම්මාන ප්‍රදානයන් ජාතික සම්මාන | 19 |
| | ඈ) විදේශ විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ වී අධ්‍යාපන සහයෝගීතා වර්ධනය කරමින් පහසුකම් සැලැස්වීම | 20 |
| | ඉ) මහජන සුභසිද්ධීන් වෙනුවෙන් කරන ලද දායකත්වය | 21 |
| | ඊ) ජාතික අධ්‍යාපන ආයතනය | 22 |
| | උ) මහජනතා දැනුවත් කිරීම් වැඩසටහන් | 22 |
| | ඌ) මධ්‍යම සංස්කෘතික අරමුදල | 24 |
| 18. | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඇතුළාන්තය | |
| | 18.1 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අගයන් | 28 |
| | 18.2 පු.වි.ප.උ. ආයතනයේ මාර්ගෝපදේශ මූලධර්ම | 28 |

18.3 ආයතනයේ කාර්‍ය සාධනය උසස්කරලීම සඳහා යෝජිත කෙටිකාලීන හා මධ්‍යකාලීන පියවර පිළිබඳ මිණුම් සාරාංශයකි. 29

18.4 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන විශේෂයන කිරීම් 30

18.5 පුරාවිද්‍යා පශ්චාත් උපාධි . ආයතන වෙසෙසියා ඒකකය 30

19. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විමර්ශන පුස්තකාලය 30

20. පුනරාවර්තන වියදම් විස්තර 32

21. ප්‍රාග්ධන වියදම් විස්තරය 32

22. ව්‍යාපෘති විස්තර (දේශීය අරමුදල්) 33

23. මූල්‍ය වියදම් විස්තරය

23.1 උපයා ගත් අරමුදල් විස්තරය 33

23.2 මූල්‍ය කාර්ය සාධන විශ්ලේෂණය 2017 34

24. මූල්‍යතත්ව ප්‍රකාශනය

24.1 මූල්‍ය තත්ව ප්‍රකාශය 35

24.2 මූල්‍ය ක්‍රියාකාරීත්ව ප්‍රකාශය 37

24.3 ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශය 39

24.4 මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 40

25. විගණකාධිපති වාර්තාව 49

## 1. හැඳින්වීම

1986 වර්ෂයේ පිහිටුවන ලද පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය පුරාවිද්‍යාව හා ඊට සම්බන්ධ අනිකුත් විසය ධාරාවන්ගේ පර්යේෂණ හා උසස් අධ්‍යාපන කටයුතු සඳහා විශේෂණය වූ ආයතනයකි. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ඊටම ආවේණික වූ පහත සඳහන් විෂය ධාරාව තුල පර්යේෂණ හා උසස් අධ්‍යාපන කටයුතු සඳහා දශක 3කට ආසන්න කාලයක් කැපවීමෙන් ක්‍රියාකොට ඇත. විශේෂයෙන්ම සමාජ පුරාවිද්‍යාව හා ඊට අදාල පර්යේෂණ කටයුතු (පුරාවිද්‍යාව සංස්කෘතික උරුමය, කෞතුකාගාර අධ්‍යයනය, කලා ඉතිහාසය සම්බන්ධ අධ්‍යයනය) පාරිසරික පුරාවිද්‍යාව (චාතුර්තක භූගර්භ විද්‍යාව හා සම්බන්ධ පාරිසරික වෙනස්වීම, පෞරාණික දේශගුණික අධ්‍යයනය, වෘක්ෂලතා ආදියේ ඉතිහාස අධ්‍යයනය, භූමි භාවිතා කිරීමේ ඉතිහාසය අධ්‍යයනය කිරීම වැනි සුවිශේෂී විෂය ධාරාවන් තුල කැපී පෙනෙන මෙහෙවරක් ඉටුකොට ඇත.

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ කටයුතු සහ අධ්‍යයන තත්ව හරහා ජාත්‍යන්තර තලයේ කීර්තිමත් ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීමට තරම් හැකියාවක් ලබා තිබීම සතුටට කරුණකි. විශේෂයෙන් ජාත්‍යන්තර තලයේ පිළිගැනීමකට ලක්ව ඇති ප්‍රකාශනයන් ඉදිරිපත් කරන ප්‍රකාශනයන් වන (Journal of Quaternary Science and Journal of Palaecology, Palaeogeography and Palaecoclimatology ) යනාදී දැනුම් කේන්ද්‍රීය මධ්‍යස්ථාන සමග සම්බන්ධ වී කටයුතු කිරීමට ලැබීම ආයතනය ලද විශිෂ්ඨ ජයග්‍රහණයකි. දැනට ලංකාවේ සිදු කරනු ලබන අධ්‍යයන අතර විද්‍යාත්මක පුරාවිද්‍යාව, පෞරාණික පාරිසරික විද්‍යාව, පරාග විද්‍යාව, පයිටොලිත විද්‍යාව, පෞරාණික දේශගුණ විද්‍යාව, චිත්‍ර සංරක්ෂණය යනාදී සුවිශේෂි විෂය ධාරාවන් පිළිබඳ ගැඹුරින් පර්යේෂණ කරන ප්‍රමුඛ ආයතනය පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයයි.

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ දැනට පවත්වාගෙන යනු ලබන අධ්‍යයන පාඨමාලා අතර පුරාවිද්‍යා ඩිප්ලෝමාව, ශාස්ත්‍රපති පාඨාමාලාව, විද්‍යාපති පාඨමාලාව සඳහා වැඩිම ශිෂ්‍ය ඉල්ලුමක් පවතින බව පැහැදිලිව පෙන්නුම් කරන කරුණකි. පුරාවිද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව ඊට ඉහලින් ඇති අනිකුත් උසස් උපාධි පාඨමාලාවන් වන දර්ශනපති, දර්ශනශූරී වැනි ඉහල උපාධි හැදෑරීම සඳහා දක්වන ප්‍රමුඛතාවය පසුගිය වසර දහයක කාල සීමවෙ තුල වර්ධනය විම තුල ආයතනයේ අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය පෙන්නුම් කිරීමක් ලෙස සැලකිය හැකිය.

## 2. දැක්ම

දකුණු ආසියාවේ පුරාවිද්‍යාව හා ඊට සම්බන්ධ අනිකුත් විෂය ධාරාවන්ගේ විෂයන්හි පර්යේෂණය හා අධ්‍යයන කටයුතුවල විශිෂ්ටත්වයේ කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම

## 3. මෙහෙවර ප්‍රකාශය

දකුණු ආසියා කලාපය තුල අතීතයේ තිබූ ඉතා වැදගත් දැනුම උසස් අධ්‍යාපනයේ දී ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීම පිණිස ශිෂ්‍යයින් පුහුණු කිරීම.

ගෝලීය පුරවැසියන්ගේ තත්වයකට පත්වීම සඳහා ප්‍රදේශයේ සිටින සියලුම ශිෂ්‍යයන්ට අවශ්‍ය දැනුම බුද්ධිය සහ කුසලතා ලබාදෙමින් පුරාවිද්‍යාව හා අදාල විෂයන් පිළිබඳව දැනුම වර්ධනය කිරීම සඳහාත් බෙදා හැරීම සඳහාත් දැනුම යොදා ගැනීම සඳහා නායකත්වය ලබාදීමට ඇප කැප වී ඇත.

ශ්‍රී ලංකා උරුමය හා සංස්කෘතිය පිළිබඳ අවබෝධයක් ඇති කිරීම ඉගෙනීම, පර්යේෂණ සහ උගත් වෘත්තින්හි රාජ්‍ය අංශයෙහි ව්‍යාපාරක හා නවෝත්පාදන පිළිබඳව අනාගත නායකයින් පරම්පරාවක් සංවර්ධනය කිරීම.

## 4. සහයෝගීතා අපේක්ෂාව

1.පුරාවිද්‍යා හා ඊට සම්බන්ධ විෂයධාරාවන් තුල විශේෂඥයන් බිහිකිරීම

2.පුරාවිද්‍යාව හා විෂ්‍ය ධාරාවන්තුල සිදුකරනු ලබන පර්යේෂණ වලින් උසස්ම ස්ථානය ලබා ගැනීම සඳහා අවශ්‍ය තත්ව වැඩිදියුණු කිරීම

3.ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික තත්වය වර්ධනය කිරීම සඳහා ආයතනික මට්ටමින් කැපවී ක්‍රියා කිරීම

## 5. කළමනාකරණ මණ්ඩලය

### නිලබලයෙන්

| | |
|---|---|
| මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර | - උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය (2018.02.28) |
| මහාචාර්ය ඩී.එම්.සේමසිංහ | - උපකුලපති, කැලණිය විශ්වවිද්‍යාලය (2017.04.28) |
| මහාචාර්ය සම්පත් අමරතුංග | - උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය ජගත් වීරසිංහ | - අධ්‍යක්ෂ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය |
| මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන | - අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල |
| ලලිත් වඩුගේ මහතා | - අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ(අධ්‍යක්ෂ) මහාමාර්ග හා උසස් අධ්‍යාපන අමාත්‍යංශය |
| මහාචාර්ය උදා හෙට්ටිගේ | - අංශ ප්‍රධාන, කැලණිය විශ්වවිද්‍යාලය |
| මහාචාර්ය ආර්.එම්.එම්.චන්ද්‍රරත්න | - අංශ ප්‍රධාන, පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| සනුජා කස්තුරිආරච්චි මිය | - අධ්‍යක්ෂ, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව |
| මහාචාර්ය පි.බී.මණ්ඩාවල | - පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව |

### විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පත්කරන ලද සාමාජිකයින්

| | |
|---|---|
| ආචාර්ය රෝලන්ඩ් සිල්වා මහතා | |
| ආචාර්ය සිරිනිමල් ලක්දුසිංහ මහතා | |
| මහාචාර්ය එස්.පද්මනාදන් මහතා | |
| මහාචාර්ය ටී.ජී.කුලතුංග මහතා | |
| එච්.එම්.එන් වරකාඋල්ල මහතා | |
| කුමුදු මාලිංග වීරක්කොඩි මහතා | - ප්‍රධාන නීති නිලධාරී, කම්කරු දෙපාර්තමේන්තුව |
| ආර්.එම්.ඒ.රත්නායක මහතා | - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාරය |
| මහාචාර්ය ප්‍රදීප් රන්දිවෙල මහතා | - කොළඹ විශ්වවිද්‍යාලය |

### කාර්යාල උපස්ථිතියෙන්

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී (ලේකම්) - චන්ද්‍රිකා ගොඩගේ මහත්මිය

### ආරාධනයෙන්

නියෝජ්‍ය මූල්‍යාධිකාරි - ඩී.එස්.පී.කුමාරසිංහ මහත්මිය (ජනවාරි/පෙබරවාරි/මැයි/දෙසාම්බර්)

සහකාර මූල්‍යාධිකාරි - රන්ජලා කාරියවසම් (ජුලි/අගෝස්තු)

## 6. අධ්‍යක්ෂවරයාගේ කාර්ය සමාලෝචනය

### අ. සංක්ෂිප්ත හැඳින්වීම

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය ප්‍රධාන වශයෙන් පුරාවිද්‍යාව, කෞතුකාගාර සංවර්ධනය උරුම හා කලා ඉතිහාසය පිළිබදව හා මෙම විෂයන් ජනප්‍රිය කිරීම හා වෘත්තීයමය කිරීම පිළිබඳව පශ්චාත් උපාධි පුහුණු කිරීම සඳහා කැපවූ ආයතනයකි. එහි සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත පීඨයක් ඇති අතර ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු තිදෙනෙකු හා කථිකාචාර්යවරු සත් දෙනෙකුගෙන් ද යුක්ත වේ.

### ආ. කාර්ය සිද්ධීන්

**ක්ෂේත්‍ර පර්යේෂණ සහ ප්‍රකාශන**

ක්ෂේත්‍ර පර්යේෂණ සිදුකිරීම පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා විශාල ධනාත්මක සංවර්ධනයක් වන සමස්ත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පීඨයේ අවශ්‍ය පරිචයක් වී ඇත. තවද සටහන් කරගතයුතු කරුණක්වී ඇතතේ එක් එක් පීඨයක් මගින් සිය පර්යේෂණ සඳහා සිසුන් සහභාගී කරවාගැනීමට ක්‍රියා කරන අතර ප්‍රකාශන මගින් ඔවුන්ගේ පර්යේෂණ සොයා ගැනීම් බෙදා හදා ගැනීමට කටයුතු කිරීමයි. 2017 වර්ෂයේදී අප විසින් පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ එසේ සොයාගැනීම් අශ්‍රයෙන් ලියවුනු වාර්තා (Memories) සටහන් 3ක් ප්‍රකාශයට පත්කොට ඇත.

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය නොයෙකුක් වෘත්තීමය පුහුණු කිරීම් හා පුරාවිද්‍යාව ජනප්‍රිය කිරීමේ වැඩසටහන් විවිධ සහතික පත් හා ඩිප්ලෝමා පාඨමාලාව මගින් ලබාදීමට හැකි වූ අතර මේ සඳහා හුදෙක් ඔවුන්ගේ පුරාවිද්‍යාව හා අදාල විෂයන් කෙරෙහි ඇති ඇල්ම හා උනන්දුව නිසා - දැනුම ලබාගැනීම සඳහා පමණක් ගාස්තු ගෙවා ඉදිරිපත්වී ඇත. සංස්කෘතික දේපල සංරක්ෂණය කිරීම සඳහා සහතික පත් පාඨමාලාව, මධ්‍යම සංස්කෘතික අරමුදලේ මූල්‍යාධාර ලබා දුන් අතර, ඒ සඳහා ඉල්ලුම් පත් 80 කට වැඩි ප්‍රමාණයක් ලැබී ඇත. පැරණි බිතුසිතුවම් හා මානව කෘති මධ්‍යම සංස්කෘතික අරමුදලේ ව්‍යාපෘතීන් වලින් ද පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ද වර්ෂ ගණනාවක් තුළ සොයා නොගත් සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය බිතුසිතුවම් හා මානවකෘති සංරක්ෂකයන් රට තුල පුහුණු කිරීමේ එකම වැඩසටහන වේ.

2017 වර්ෂයේදී පුරාවිද්‍යා පශ්චාත් උපාධි අයතනය පුරා ජෛව විවිධත්වය (Paleo-biodiversity) ඩිප්ලෝමා පරීක්ෂණය, සිසුන් 46 දෙනෙක් අවසන් පරීක්ෂණයට පෙනී සිටිමෙන් සම්පූර්ණ කරන ලදී. මෙම වැඩසටහනට ආධාර ලබා දුන්නේ පරිසර අමාත්‍යංශය මගිනි.

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය මඟින් පවත්වන වැඩසටහන්හී වෘත්තීය භාවය සහ ජනප්‍රියතාවය වැඩි දියුණු කිරීමේ අරමුණෙන් අස්ථි පුරාවිද්‍යා (Osteoarchaeologhy) සම්බන්ධයෙන්වූ වැඩමුළුවක් පුරාවිද්‍යා දෙපාර්තම්න්තුවේ සේවය කරන පුරාවිද්‍යා නිලධාරීන් සඳහා පවත්වන ලදී.

## ඇ. අසාර්ථකවීම් හා නිර්දෝශිභාවය

### ශාස්ත්‍රීය වැඩසටහන් සහ ඉගැන්වීම්

2017 වර්ෂයේ දී පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින්, පුරාවිද්‍යාව, කෞතුකාගාර සංවර්ධනය හා උරුමය පිළිබඳව ඩිප්ලෝමා වැඩසටහන් තුනක් (03 ක්) ඉදිරිපත් කරන ලදී. මේ වැඩසටහන් සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේ හා විශේෂයෙන් පුරාවිද්‍යාව සඳහා සිසුන් ලියාපදිංචි වීමේ අඩුවීමක් දකිනට ලැබුණි. මෙම අඩුවීම සඳහා හේතූන් ගැටළු සහගත තත්වයක් ගනියි. පළමුවෙන්ම කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා ශාස්ත්‍රපති උපාධිය වැනි සාපේක්ෂ වශයෙන් එක හා සමාන සුදුසුකම් ලබාගැනීමේ වඩාත් පහසු වැඩසටහන් කිහිපයක් පැවතුනි. අද වන විට පුරාවිද්‍යා පශ්චාත් උපාධි, ශ්‍රී ජයවර්ධනපුර, රුහුණු හා පේරාදෙනි විශ්වවිද්‍යාලයන්ගෙන් ද පිරිනමනු ලැබේ. පු.වි.ප.උ. ආයතනය විසින් පුරාවිද්‍යාව හා උසස් උපාධි පුහුණුව සඳහා ජනප්‍රිය ප්‍රවේශයක් අනුගමනය නොකළයුතු බවට තීරණය කර ඇත.

මගේ අදහසට අනුව පශ්චාත් උපාධි මට්ටමේ ඉගැන්වීම් තාමත් අසතුටු දායක තත්වයක පවතී. බොහෝ පීඨයන්ට උපාධි අපේක්ෂක ඉගැන්වීම් හා උපාධිධාරී ඉගැන්වීම් සඳහා වෙනසක් තිබිය යුතු බවට අවබෝධ දී නොමැත. සාකච්ඡා වාර ශිෂ්‍ය කේන්ද්‍රගත ක්‍රියාකාරකම් හා බහු කතිකාචාර්ය ඉගැන්වීම් වන නව ඉගැන්වීම් ක්‍රම පු.වි.ප.උ. ආයතනය සිදුකරනු නොලැබේ. බොහෝ පීඨ ගතානුගතික දේශන පැවැත්වීමෙන් තෘප්තියට පත්ව ඇත. ඇතමුන් විසින් ජනප්‍රිය උසස් පෙළ පුනරීක්ෂණ පාඩම් කරන අයුරින් දේශන පවත්වාගෙන යනු ලැබේ. එනම් සති අන්තයේ සම්පූර්ණ දිනකදී දේශන පවත්වා පාඨමාලාවක් එක්වර අවසන් කිරීමයි. මා අදහස් කරන්නේ රටේ මානව විෂයන් (Humanities) පශ්චාත් උපාධි මට්ටමේ දී මෙය පොදු ප්‍රශ්නයක් බවට සැළකිය හැකි බවය.

## ඈ. අනාගත සැළැස්ම

පු.වි.ප.උ. ආයතනය වෙත ඇති ඉතාමත් ප්‍රබල වී ඇත්තේ යටිතල පහසුකම් සංවර්ධන සැළැස්මක් දියත්කොට ජාත්‍යන්තර සිසුන් බඳවා ගැනීමේ ක්‍රමයක සැළසුම් කිරීමය.

## 7. ආයතනික සංවිධාන ව්‍යුහය



## 8. සම්පත් හා ශිෂ්‍යයන් පිළිබඳ විස්තර

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | මුළු අධ්‍යයන කාර්ය මණ්ඩලය | *අධ්‍යයන සහායක | **පරිපාලන කාර්ය මණ්ඩලය | මුළු අනධ්‍යයන කාර්ය මණ්ඩලය |
|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 33 | 11 | 03 | 05 | 19 |
| ශාස්ත්‍රපති පුරාවිද්‍යා (පර්යේෂණ මගින්) | 33 | | | | |
| ශාස්ත්‍රපති - පුරාවිද්‍යා පර්යේෂණ (MA) දේශන හා පර්යේෂණ මගින් | 13 | | | | |
| විද්‍යාපති - පුරාවිද්‍යා දේශන/පර්යේෂණ | 63 | | | | |
| දර්ශනපති -පුරාවිද්‍යා | 41 | | | | |
| දර්ශන විශාරද පුරාවිද්‍යා | 35 | | | | |
| **එකතුව** | **218** | 11 | 03 | 05 | 19 |

*ස්ථිර ජ්‍යෙෂ්ඨ මහාචාර්ය,මහාචාර්ය,ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය,කතිකාචාර්ය,ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරී
**නියෝජ්‍ය මූල්‍යාධිකාරී,ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී,සහකාර ලේඛකාධිකාරී,සහකාර මූල්‍යාධිකාරී

## 8.1 උපාධි නොවන පාඨමාලා 2017/2018

| පාඨමාලාව | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| පුරා ජෛව විවිධත්වය | 46 |
| කලා ඉතිහාසය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 18 |
| **එකතුව** | **64** |

## 9. දේශීය ශිෂ්‍යයන් පිළිබඳ විස්තර 2017/2018

| පාඨමාලාව | 2017 බඳවා ගැනීම් | 1 වන වසර ශිෂ්‍යයින් | 2 වන වසර ශිෂ්‍යයින් | 3 වන වසර ශිෂ්‍යයින් | 4 වන වසර ශිෂ්‍යයින් | උපාධිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා ඩිප්ලෝමාව | 33 | 33 | - | - | - | 26 |
| පුරාවිද්‍යා ශාස්ත්‍රපති පර්යේෂණ මගින් | 07 | 07 | 26 | - | - | 01 |
| පුරාවිද්‍යා ශාස්ත්‍රපති දේශන පර්යේෂණ මගින් | 01 | 01 | 12 | - | - | 01 |
| පුරාවිද්‍යා විද්‍යාපති දේශන පර්යේෂණ මගින් | 15 | 15 | 48 | - | - | 15 |
| පුරාවිද්‍යා දර්ශනපති | 04 | 04 | 37 | - | - | 02 |
| දර්ශන විශාරද පුරාවිද්‍යා | 03 | 03 | 06 | 26 | - | 01 |
| **එකතුව** | **63** | **63** | **129** | **26** | **-** | **46** |

## 10. අධ්‍යයන කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| අධ්‍යක්ෂ * | 01 | * | 01 |
| ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | 03 | 03 | - |
| ජ්‍යෙෂ්ඨ කථිකාචර්ය (1 ශ්‍රේණිය) | 03 | 02 | 01 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචර්ය (11 ශ්‍රේණිය) | 03 | 03 | 01 |
| කථිකාචාර්ය (ආධුනික) | 01 | 01 | -- |
| ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරි | 01 | -- | 01 |
| **එකතුව** | **12** | **09** | **03** |

*වැ.බ. අධ්‍යක්ෂ තනතුර 01.07.2016 සිට 31.08.2017 සහ 2017.09.04 දින සිට නිසිබලධාරිවරයකු කටයුතු කර ඇත.

11. පරිපාලන සහ මුදල් කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
| --- | --- | --- | --- |
| නියෝජ්‍ය ලේඛකාධිකාරි | 01 | -- | 01 |
| නියෝජ්‍ය මූල්‍යාධිකාරි | 01 | 01 | -- |
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි | 01 | 01 | -- |
| සහකාර ලේඛකාධිකාරි | 01 | 01 | -- |
| සහකාර මූල්‍යාධිකාරි | 01 | 01 | -- |
| **එකතුව** | **05** | **04** | **01** |

12 . අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
| --- | --- | --- | --- |
| විද්‍යාත්මක සහකාර (1 ශ්‍රේණිය) | 01 | 01 | -- |
| විද්‍යාත්මක සහකාර (11 ශ්‍රේණිය) | 02 | 02 | -- |
| **එකතුව** | **03** | **03** | -- |

## 13. අනධ්‍යයන කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත | තත්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| පොත් තබන්නා (II ශ්‍රේණිය ආ බණ්ඩය) | 01 | 01 | -- |
| දත්ත සැකසුම් ක්‍රියාකරු/විශේෂ ශ්‍රේණිය | 01 | -- | 01 |
| ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර/ලිපිකරු | 02 | 02 | -- |
| ලිපිකරු (1 ශ්‍රේණිය) | 01 | 01 | -- |
| ලිපිකරු (111 ශ්‍රේණිය) | 01 | 01 | -- |
| ලඝුලේඛිකා ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර | 01 | 01 | -- |
| තාක්ෂණික නිලධාරි ( I ශ්‍රේණිය ) | 01 | 01 | -- |
| (II ශ්‍රේණිය ආ බණ්ඩය) | 01 | -- | 01 |
| මාණ්ඩලික සහකාර/ පුස්තකාල තොරතුරු සහකාර | 01 | 01 | -- |
| පුස්තකාල තොරතුරු සහකාර (III ශ්‍රේණිය) | 02 | 01 | 01 |
| පරිගණක යෙදුම් සහකාර ( 1 ශ්‍රේණිය) | 01 | 01 | - |
| පරිගණක යෙදුම් සහකාර ( 111 ශ්‍රේණිය) | 01 | 01 | - |
| දුරකථන ක්‍රියාකරු නොහොත් පිළිගැනීමේ නිලධාරි (11 ශ්‍රේණිය) | 01 | 01 | -- |
| රියදුරු ( 11 ශ්‍රේණිය) | 02 | 02 | -- |
| විද්‍යාගාර සහායක (පහළ ශ්‍රේණිය) | 01 | 01 | -- |
| කම්කරු (I ශ්‍රේණිය) | 01 | 01 | -- |
| **එකතුව** | **19** | **16** | **03** |

## 14.පර්යේෂණ විස්තරය - නවෝත්පාදන සහ ප්‍රකාශන

| **විෂයය** | **ප්‍රකාශිත** |
|---|---|
| සඟරා සංඛ්‍යාව | 05 |
| පොත් සංඛ්‍යාව | 04 |
| ලිපි සංඛ්‍යාව | 16 |
| වෙනත් | - |
| **මුළු එකතුව** | 25 |

## 15. වැඩසටහන් විස්තර - සම්මේලන සහ වැඩමුළු

| **විෂයය** | **කටයුතු කළ** | **සම්පූර්ණ කළ** | **ඉදිරිපත් කළ** |
|---|---|---|---|
| පශ්චාත් උපාධි වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 01 |
| ඩිප්ලෝමා වැඩසටහන් සංඛ්‍යාව | 01 | 01 | 01 |
| සහතික පත්‍ර වැඩසටහන් සංඛ්‍යාව | 09 | 09 | 09 |
| වෙනත් | - | - | - |
| **මුළු එකතුව** | 11 | 11 | 11 |

## 16. ලබාගත් සම්මාන පිළිබඳ විස්තර

| **විෂයය** | **සම්මාන ප්‍රමාණය** | **කථිකාචාර්යවරුන් ප්‍රමාණය** | **ශිෂ්‍යයින් ප්‍රමාණය** |
|---|---|---|---|
| දේශීය සම්මාන | - | - | - |
| ජාතික සම්මාන | 09 | 01 | - |
| ජාත්‍යන්තර සම්මාන | 03 | 01 | - |
| වෙනත් | - | - | - |
| **මුළු එකතුව** | **12** | **02** | - |

## 17. පර්යේෂණ කාර්යයන්

### අ) පර්යේෂණ ප්‍රගතිය

| පර්යේෂණ වැඩ සටහනෙහි නම | අරමුදල් | පර්යේෂණ පිළිබඳ කෙටි විස්තරය |
|---|---|---|
| 1. සංක්‍රමණික දඩයම්කරුවන්<br><br>2. මධ්‍ය හොලෝසීන යුගයේ දේශගුණික වෙනස්වීම සහ මානව අනුවර්තනය පිළිබඳ අධ්‍යයනයක්<br><br>**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව** | රාජ්‍ය අරමුදල්<br><br>ජාතික විද්‍යා පදනම (පර්යේෂණ ප්‍රදාන අංක ආර්ජී/අයිකේ/ 2007/01) | මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වූයේ අධ්‍යයනයට ලක්වන ප්‍රදේශයේ පැවති ප්‍රාග් ඓතිහාසික ජනාවාස වර්ධනයට අදාල භූ කාල මානය ස්ථාපිත කිරීමයි. මෙය දඩයම්කරුවන්ගේ සංක්‍රාන්තිය පර්යේෂණ ව්‍යාපෘතියට අළුත් අංගයකි.<br><br>මෙම සමීක්ෂණයේ අරමුණ වූයේ අධ්‍යයනයට ලක්වන ප්‍රදේශය තුළ පවතින ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ස්ථානවල භූගෝලීය ව්‍යාප්තිය හඳුනා ගැනීමයි. |
| 1. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සහ ඓතිහාසික යුගවලට අයත් මානව හා සත්ත්ව අවශේෂ පිළිබඳ අධ්‍යයනය<br><br>**මහාචාර්ය ගාමිණී අධිකාරි මයා** | රාජ්‍ය අරමුදල් | සත්ව පුරාවිද්‍යාව පිළිබඳ දත්ත ගබඩාව වැඩිදියුණු කිරීම<br>ප්‍රාග් ඓතිහාසික යුගයේ සිය ඓතිහාසික යුගය දක්වා මිනිසුන්ගේ ආහාර රටාව පිළිබඳ අවබෝධය ලබා ගැනීම<br>ප්‍රාග් ඓතිහාසික හා ඓතිහාසික යුගයේ මානව අවශේෂ පිළබඳ දත්ත එකතු කිරීම<br>ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යාව සහ සත්ත්ව පුරාවිද්‍යාව පිළිබඳ ඉදිරි පරම්පරාව සඳහා සම්පත් දායකයන් පුහුණු කිරීම |
| 1. දකුණු ඉන්දියාවේ අත්තිරම්පක්කම් පෞරාණික මානව වංශ විද්‍යාත්මක ස්ථානයේ ටැපනොමි වාර්තාව පිළිබඳ සලකා බැලීම<br>2. ශ්‍රී ලංකාවේ වගා වී වර්ගවල ආරම්භය<br>3. මධ්‍ය හොලෝසීනයේ පරිසර වෙනස්වීම පිළිබඳ වාර්තා<br><br>**ආචාර්ය ටී.ආර්. ප්‍රේමතිලක මයා** | ජාත්‍යන්තර භූගර්භ විද්‍යා පිළිබඳ සංවිධානය සහ මානව සහ ජෛව ගෝල සංවිධානය මඟින් ලබාදුන් මූල්‍යාධාර ඊට අමතරව ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ කවුන්සිලය ලබාදුන් මූල්‍ය | මෙම පර්යේෂණ ව්‍යාපෘතියේ මූලික අරමුණ වූයේ දකුණු ආසියාතික ප්‍රදේශවල ව්‍යාප්තව් තිබූ අති පුරාණ මානව සංස්කෘතික තත්වයන් සහ ඊට සම්බන්ධ පුරාණ පරිසර වාර්තා සහ දේශගුණික තත්වයන් පිළිබඳ වෙනස්වීම පිළිබඳ සොයා බලා වාර්තා කිරීමයි. මේ යටතේ අති පෞරාණික මානව ක්‍රියාකාර්ත්වය හා සම්බන්ධ ගපල් ආයුධ සැකසීමේ තාක්ෂණය පුරාණ වෘක්ෂලතා ආදිය සහ මෝසම් දේශගුණික තත්වය පිළිබඳ වෙනස්වීම පිළිබඳ තත්ව අවබෝධ කිරීම සඳහා කටයුතු කිරීම සිදුකරන ලදී. එසේම අති පුරාණ පරිසර වෙනස්වීමේ තත්ව අවබෝධ කිරීම සඳහා අවශ්‍ය වන පර්යේෂන විධික්‍රම සහ තාක්ෂණික තත්වයන් |

| | | |
|---|---|---|
| | ආධාර | වර්ධනය කිරීම සඳහා පශ්චාත් උපාධි ශිෂ්‍යයන් පුහුණු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පර්යේෂණ පහසුකම් සකස් කිරීම පිළිබඳ සාකච්ඡා සම්මන්ත්‍රණ මූලික මට්ටමේ විද්‍යාගාර පර්යේෂණ මෙහිදී සිදු කරන ලදී.<br>එසේම ශ්‍රී ලංකාවේ වී වගා කිරීමේ සංස්කෘතිය ආරම්භ වීමේ මූලික තත්වයන් පිළිබඳ අවබෝධ කිරීම සඳහා පර්යේෂණ කටයුතුවල නියැලීම ද එම ව්‍යාපෘතිය තුළ සිදුකර ඇත. මෙහි විස්තර කරන ලද පර්යේෂණ වලින් මෙතෙක් ලද ප්‍රගතිය ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණ පත්‍රිකා කිහිපයක් මගින් ඉදිරිපත් කර ඇත. |
| මහනුවර යුගයේ සිතුවම්හි තාක්ෂණය පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය<br><br>**ආචාර්ය අර්ජුන තන්තිලගේ මයා** | රාජ්‍ය අරමුදල් | මෙම පර්යේෂණය මූලික වශයෙන් කේන්ද්‍ර වන්නේ මහනුවර යුගයේ සිතුවම්හි තාක්ෂණය පිළිබඳවය. ශ්‍රී ලංකාව තුළ ව්‍යාප්තව ඇති මහනුවර යුගයට අයත් සිතුවම් සහිත විහාර අතුරින් නියැදි 40 ක් පමණ රැස්කොට ඒවා පු.වි.ප.උ.ආයතනයේ සංස්කෘතික ද්‍රව්‍ය විශ්ලේෂන<br>විද්‍යාගාරය මගින් විශ්ලේශණයට භාජනයකරන ලදි. මෙහිදි විද්‍යාත්මක ක්‍රමවේද 2 ක් යටතේ එම<br>නියැදි විශ්ලේශන කරන ලදි.<br>- හරස්කඩ විශ්ලේශනය<br>- FTIR හා XRF හරහා වර්ණක විශ්ලේෂනය<br>මෙහිදි ලබාගත් ප්‍රතිඵල ඇතුලු කොටස සමස්ත ව්‍යාපෘතියෙන් අනාවරණය කරගනු ලැබූ තොරතුරු පු.වි.ප.උ.ආයතනයේ memoirs 4 ක් යටතේ<br>ප්‍රකාශයට පත්කොට ඇත. |

| | | |
|---|---|---|
| 1. ඉහළ මා ඔය නිම්ණයේ ජනාවාසකරණ රටාව අධ්‍යයනය<br><br>මධ්‍ය මා ඔය නිම්නයේ දුංකුඹුර සුසානයෙහි අධ්‍යයනය<br><br>**ආචාර්ය රෝස් සෝලංගආරච්චි මිය** | රාජ්‍ය අරමුදල් | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වනුයේ ඉහළ මා ඔය නිම්ණයේ ජනාවාසකරණ ව්‍යාපෘති රටාව කාලානුරූපීවයවත්, භූ විද්‍යාත්මකවත් හඳුනාගැනීමය. ප්‍රාග්ඓතිහාසික යුගයේ සිට පශ්චාත් ඓතිහාසික යුගය දක්වා කාලය තුළ අධ්‍යයන ප්‍රදේශයේ ක්‍රියාත්මක වූවා වූ සාමාජීය ගතිකයන් පිළිබඳ සම්පූර්ණ අදහසක් ලබා ගැනීම මෙයට ඇතුළත් වේ.<br><br>මහනුවර, හතරලියද්ද, දුංකුඹුර වර්තමාණ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මඟින් පුරාවිද්‍යා උරුමයන් අතුරුදහන් වීමට පෙර, කඩිනම් මෙහයුමක් ලෙස මෙම ව්‍යාපෘතිය දියත් කරන ලදී. විනාශයට පත්වන්නාවූ අවශේෂයන් පිළිබඳ නිවැරදි වාර්තාවක් සකස්කිරීම මෙම ව්‍යාපෘතියෙහි අරමුණයි.<br>මෙම මුදවා ගැනීමේ පුරාවිද්‍යා ව්‍යාපෘතියෙහි ප්‍රථිඵල, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයෙහි ප්‍රකාශන මාලාවෙහි "*Memoir*" යටතේ ('මුදවා ගැනීමේ පුරාවිද්‍යාවඃ මධ්‍ය මා ඔය නිම්නයේ දුංකුඹුර සුසානයෙහි අධ්‍යයනය')ප්‍රකාශණයට නියමිතය. |
| 1.යාන් ඔය මධ්‍ය නිම්න පර්යේෂණ ව්‍යාපෘතිය<br><br>2යෝජිත කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතියේ පුරාවිද්‍යා හානි ඇගයුම් සමීක්ෂණය<br><br>3 යෝජිත කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතිය පුරාවිද්‍යා හානි | රාජ්‍ය අරමුදල්<br><br>මහනගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යංශය | යාන්ඔය මධ්‍ය නිම්නයේ මරදම්මඩුව හා නැකවැව මහාශිලා සුසාන භූමිවල කැණිම්වලින් හමුවූ පුරාවස්තු විශ්ලේෂණය කිරීම<br><br>තෙත් කලාපයේ සුසාන හා සම්බන්ධිත භූගෝලීය ලක්ෂණ හඳුනාගැනීම<br><br>උක්ත කලාපයේ සිතියම්ගත කිරීම පදනම් කර ගනිමින් භූගෝලීය දත්ත ගොනුවක් සකස් කිරීම<br>අවසාන කැණිම් වාර්තා සඳහා පුරා වස්තු විශ්ලේෂනය හා සැකසීම<br><br>පුරාවිද්‍යා හානි ඇගයුම් සමික්ෂණ අවසාන වාර්තාව |

| | | |
|---|---|---|
| ඇගයුම් සමීක්ෂය මොණරාගල දිස්ත්‍රිකකය<br><br><br><br>**රංජිත් බණ්ඩාර දිසානායක මයා** | වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව | පුරාවිද්‍යා හානි ඇගයුම් අවසාන වාර්තාව |
| හින්දු බෞද්ධ ආගමික සන්හිදියාව ශ්‍රී ලංකා ඉතිහාසයේ මූලාරම්භයේ සිට ක්‍රි .ව. 18 වැනි සියවසදක්වා.<br><br><br><br><br><br><br><br><br><br>**ආචාර්ය ඩී.පී.ගම්ලත්** | රාජ්‍ය අරමුදල් | හින්දු බෞද්ධ සන්හිදියාව පිළිබඳ ගැඹුරු තනි පර්යේෂණයක් ලංකාව තුළ මේ දක්වා සිදු කර නැත. මෙම මාතෘකාවට අදාළව ඓතිහාසික සහ පුරාවිද්‍යා දත්ත පිළිබඳ සම්පූර්ණ එකතුවක් ද මේ දක්වා ඉදිරිපත් වී නැත. එහෙත් හින්දු සහ බෞද්ධ දෙපිරිසගේම සමීප සම්බන්ධතා හෙළිදරව් වන බොහෝ පුරාවිද්‍යා සාධක ඇත්තේය. මෙහිදී බෞද්ධයින් හින්දු දෙවිවරුන්ට (විශ්ණු සහ කතරගම ) වන්දනාමාන කරුණුයේ ඇයිද යන්නත් බුදුගෙය තුළ හින්දු දෙවිවරුන් ඉදිරිපත් කර තිබෙන ක්‍රමවේදය පිළිබඳවත් ගැඹුරින් සාකච්ඡා කෙරේ. පර්යේෂණ කාල රාමුව ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ක්‍රිස්තු වර්ෂ 18 වන සියවස අවසානය දක්වාය. |
| විසිවන සියවස මුල සහ මැද බස්නාහිර පලාතේ බෞද්ධ විහාර සිතුවම් අධ්‍යයනය<br><br>මධ්‍යම මහනුවර සම්ප්‍රාදායේ සිතුවම් තාක්ෂණ අධ්‍යායනය<br><br>**එන්.පී.ආර්.නන්කඳුර මහතා** | රාජ්‍ය මුදල්<br><br><br>රාජ්‍ය මුදල් | මෑතකාලීන අතීතයේ සමාජ සංස්කෘතිය අධ්‍යයන කිරීම මෙහි මුලික අරමුණයි<br><br>නූතන කාන්තා විෂය ගොඩනැගීම අධ්‍යයන කිරීම |

**ආ. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන සේවක මණ්ඩලය විසින් සංවිධානය කරනු ලැබූ වැඩමුළු හා ක්‍ෂෙත්‍ර වැඩසටහන්**

**මහාචාර්ය ගාමිණී අධිකාරි**

**වැඩමුළු**

i.ෆොසිල පරිරක්ෂණය පිළිබඳ වැඩමුළුව

ii.සත්ත්ව පුරාවිද්‍යාව පිළිබඳ වැඩමුළුව

iii.ප්‍රාග් ඓතිහාසික පුරාවිද්‍යා සහ සත්ත්වපුරාවිද්‍යාව - වැඩමුළු මාලාව

iv.රූප සටහන් හා තාක්ෂණික සටහන් පිළිබඳ වැඩමුළුව

**ක්‍ෂෙත්‍ර වැඩසටහන්**

i.පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, අනුරාධපුර දත්ත හා විශ්ලේෂණ අංශයේ ප්‍රාග් ඓතිහාසික ස්ථානවලින් ලද සත්ත්ව අවශේෂ අධ්‍යයනය

ii.අනුරාධපුරයේ ජෛවවිවිධත්ව, පුරාජෛවවිවිධත්ව හා පුරාවිද්‍යාත්මක ගවේෂණය(2017/ ජුනි

iii.යාල ජාතික වනෝද්‍යානයේ ජෛවවිවිධත්ව හා පුරාජෛව විවිධත්ව ගවේෂණය (2017/සැප්තැම්බර්)

**ආචාර්ය ටී.ආර් ප්‍රේමතිලක**

**වැඩමුළු**

අන්තර්ජාතික භූගර්භ විද්‍යාව පිළිබඳ සංවිධානය සහ මානව ජෛවගෝල සංවිදානය ඉන්දියාවේ ශර්මා මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ වී කරන ලද මැදිහත්වී ම මත ඉන්දියාවේ පොන්ඩිචරි විශ්වවිද්‍යාලයේ පෞරාණික පරිසර විද්‍යාව පිළිබඳ ආයතනය තුල පවත්වන ලද වැඩමුළුවව. මෙම වැඩමුළුව සඳහා පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය නියෝජනය කරමින් ආචාර්ය ටි.ආර් ප්‍රේමතිලක මහතා සහ මෙහි ඉගෙනුම ලබන සිසුන් තිදෙනෙකු සමග සම්බන්ධ වී දකුණු ආසියාතික කලාපයේ පෞරාණික පරිසර විද්‍යාව හා සම්බන්ධ පර්යේෂණ කටයුතු වල පුහුණු වීමට අවස්ථාව ලබාගැනීම.

ඊට අමතරව මෙම වැඩමුළු සඳහා ඉන්දියාවේ වෙනත් ප්‍රදේශවලින් සහභාගී වූ සිසුන් සහ පෞරාණික පරිසර විද්‍යාඥයින් සහ ප්‍රාග් ඉතිහාසඥයින්, භූගර්භ විද්‍යාඥයින් කිහිපදෙනෙකු සම්බන්ධවීම විශේෂත්වයකි.

**ආචාර්ය අර්ජුන තන්තිලගේ**

**වැඩමුළු**

i.එක්දින ප්‍රායෝගික වැඩමුළුවසංවිධානයකිරීම- PGIAR 19/05/2017

ii.කෞතුකාගාර ප්‍රදර්ශනය සඳහාඩිජිටල් තාක්‍ෂණයේඋපයෝගිතාවය : Photogrammetry පිළිබඳවිශේෂදේශනයහා ප්‍රායෝගික වැඩමුළුව, දේශක : Prof. Sarah Kenderdine, Director, Laboratory foe innovation in Galleries, Libraries, Archives and Museums of New South Wales

**ක්ෂේත්‍ර වැඩසටහන්**

01). මහනුවරයුගයටඅයත් සිතුවම්සහිත විහාරස්ථානආශ්‍රිත බිතුසිතුවම් තාක්‍ෂණයපිළිබඳ පළාත් 5 ක් ආශ්‍රිතව සිදුකරන ලද ක්ෂේත්‍ර පර්යේෂණ කටයුතු ( මෙහිදීඑම බිතුසිතුවම්හිබන්ධනමාධ්‍යහාභාවිතකරන ලද වර්ණක හඳුනාගැනීමත් සංස්කෘතික ද්‍රව්‍ය විශ්ලේශන රසායනාගාර හර හා එම නියැදි විශ්ලේෂනයට භාජනය කිරීම)

02). Sri Lanka in the World Atlas of Maritime Buddhism ජාත්‍යන්තර සහයෝගීතා ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති සම්බන්ධීකාරකවශයෙන්කටයුතු කිරීම හා තෝරාගත් පුරාවිද්‍යාත්මකස්ථාන3D ඡායාරූපකරණය කිරීමේ ක්ෂේත්‍ර කටයුතු සම්බන්ධීකරණය කිරීම (World Atlas of Maritime Buddhism International Project නවදකුණුවේල්සය, ඕස්ට්‍රේලියාව හා ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යා පශ්චාත්උපාධි ආයතනය සමඟ එක්ව සිදුකරන සහයෝගීතා ව්‍යාපෘතියකි. මේ සඳහා මූල්‍යමය අනුග්‍රහය ඕස්ට්‍රේලියානු පර්යේෂණ කවුන්සිලය මගින් ප්‍රදානය කොට ඇත)

03). ඉහත ව්‍යාපෘතියට සමගාමීව කොළඹ ජාතික කෞතුකාගාරයෙහි තැන්පත් කොට ඇති තෝරාගත් පුරාකෘති 3D ඡායාරූපකරණය මගින් ඡායාරූපකරණය කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

**ආචාර්ය රෝස් සෝලංගආරච්චි**

**"ආකෘති/ආදේශන කැණීම්"** විද්‍යාපති උපාධි අපේක්ෂකයන් (මධ්‍යම සංස්කෘතික අරමුදලේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ද ඇතුලත්ව) සඳහා .

**වැඩමුළුව පිළිබඳව කෙටි හැඳින්වීම:**

● විවිධ ප්‍රදේශයන්හි පිහිටා ඇති පුරාවිද්‍යාත්මක ස්ථානයන්හි සිදුකරන්නාවූ පුරාවිද්‍යාත්මක කැණීමකට යොමුවීමට ප්‍රථමයෙන් ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය මූලික කුසලතාවයන් සහ මූලික දැනුම ලබාදීම මෙහි ප්‍රධාන අරමුණයි. මේ සඳහා දේශන ශාලාවේදී ලබාදෙන්නාවූ උපදෙස් මෙන්ම ප්‍රායෝගික පුහුණු සැසි මාලාවක් එක් එක් ශිෂ්‍යයා වෙනුවෙන් ලබාදෙන අතර පහතින් දක්වා ඇති අරමුණුද සම්පූර්ණ කරනු ඇත.

● කාර්යක්ෂමවත්, නිවැරදිවත්, කැණීම් ක්‍රමවේදයන් සහ ශිල්පීය ක්‍රම භාවිතා කරන්නාවූත්, එම කාර්යයන් නිසිපරිදි වාර්තාගත කරන්නාවූත්, සුදුසුකම් සහිත කැණීම්කරුවෙකු මෙන්ම ක්ෂේත්‍ර පුරාවිද්‍යාඥයෙකු ශ්‍රී ලංකා පුරාවිද්‍යා ක්ෂේත්‍රය සඳහා දායද කිරීම.

● ඵලදායී හා කාර්යක්ෂම කැණීම් ව්‍යාපෘතියක් සඳහා අත්‍යවශ්‍යම වූ 'කණ්ඩායම් හැඟීම' සහිත පුරාවිද්‍යාඥයෙකු වීම සඳහා පුහුණුවක් ලබා දීම.

වැඩමුළුවේ නම :**'ගල් ආයුධ තාක්ෂණය පිළිබඳ වැඩමුළුව'** (ආචාර්ය නිමල් පෙරේරා සමඟ)විද්‍යාපති උපාධි අපේක්ෂකයන් (මධ්‍යම සංස්කෘතික අරමුදලේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ද ඇතුලත්ව) සඳහා

**වැඩමුළුව පිළිබඳව කෙටි හැඳින්වීම:**

● පුරාවිද්‍යා සන්දර්භය තුළ අනාවරණය කරගන්නාවූ ශිලා ආයුධවල භාවිතය සහ ඒවායෙහි නිපදවීමේ ක්‍රියාවලිය හඳුනා ගැනීම සඳහා දේශන ශාලාවේදී දෙනු ලබන්නා වූ සම්පූර්ණ උපදෙස් සහ පුරාතණ තාක්ෂණය පිළිබඳ නිපදවා ඇති මානව විද්‍යා චිත්‍රපට පිළිබඳ විමර්ශණය කිරීමට අදාළ පුහුණුව ලබාදෙනු ලැබේ.

**වැඩමුළුවේ නම 'මානව විද්‍යාව සහ චිත්‍රපටකරණය පිළිබඳ වැඩමුළුව'** :
විද්‍යාපති උපාධි අපේක්ෂකයන් (මධ්‍යම සංස්කෘතික අරමුදලේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ද ඇතුලත්ව) සඳහා වු

**වැඩමුළුව පිළිබඳව කෙටි හැඳින්වීම:**

වැඩමුළුව තුළින්, පුරාවිද්‍යාඥයකුට, මානවවංශ නියෝජනයක මාදිළියක් ලෙස චිත්‍රපටයක් භාවිතා කළ හැකි ආකාරය පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ. විවිධ සංස්කෘතින්ට අයත් මානව විද්‍යාත්මක පැතිකඩයන් හා බැඳුණු තෝරාගත් මානවවංශ සහ වාර්තාමය චිත්‍රපට, මානව විද්‍යාත්මක පර්යේෂණ ක්‍රමවේදයන් සහ ඒවායෙහි ප්‍රථිඵල පිළිබඳ මූලික අදහසක් ලබාදීම සඳහා යොද ගනු ලබයි.

**වැඩමුළුවේ නම 'පුරාවිද්‍යාත්මක මැටි මෙවලම් විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව'** : විද්‍යාපති උපාධි අපේක්ෂකයන් (මධ්‍යම සංස්කෘතික අරමුදලේ සහ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන්ද ඇතුලත්ව) සඳහා වූ

**වැඩමුළුව පිළිබඳව කෙටි හැඳින්වීම:**

- පුරාවිද්‍යාඥයන් විසින් මැටි මෙවලම් අවශේෂයන් විශ්ලේෂණයේදී සිදුකරනු ලබන්නාවූ හඳුනාගැනීම ( මාදිළි, භාවිතය සහ මැටි මෙවලම් නිපදවීමේ ක්‍රියාවලිය), වර්ගීකරණය, සැලසුම්කරණය සහ අර්ථ නිරූපණය පිළිබඳව මෙම වැඩ මුළුවෙහිදී ආවරණය කරනු ලැබේ.

**ඩී.එම්.ආර්.ඒ. බණ්ඩාර මහතා**

**වැඩමුළු**

i. මධ්‍යම සංස්කෘතික අරමුදලේ දඹුල්ල ව්‍යාපෘතිය මඟින් සංවිධානය කළ මාතලේ හා ගලේවෙල අධ්‍යාපන කොට්ඨශවල පාසැල්වල ඉතිහාසය විෂය භාර ගුරුවරුන් සඳහා එක්දිනවැඩ මුළුව

ii. කළුතර හා මතුගම අධ්‍යාපන කොට්ඨාශවප ඉතිහාසය විෂය භාර ගුරුවරුන් සඳහා වූ නේවාසික වැඩමුළුව

**එන්.පී.නන්කුදුරමහතා**

**වැඩමුළු**

i. බස්නාහිර පලාතේ විහාර බිතු සිතුවම්වල තාන්තාරූප අධ්‍යයන කිරීමේ ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහන සඳහා කටයුතු කිරීම සහ කලා ඉතිහාසය අධ්‍යයනය කිරීමේ වැඩමුළු 02 ක් පැවැත්වීම

## ඇ). 2017 වර්ෂයේ දී ලැබූ ජාතික හා ජාත්‍යන්තර සම්මාන ප්‍රදානයන් ජාතික සම්මාන

**ආචාර්ය ටී.ආර් ප්‍රේමතිලක**

**1. ජනාධිපති සම්මාන ප්‍රදානය (දේශීය)**

පහත සඳහන් ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන ලැබීම සඳහා සුදුසුකම ජාතික විද්‍යා කවුන්සිලය මගින් තීරණය කර ඇත.

**ප්‍රකාශනයේ නම**

දකුණු ඉන්දියාවේ පොරුන්දල් ස්ථානයේ සිදුකරන ලද කැණීම් ඇසුරෙන් ඉදිරිපත් කරන ලද පෙයිටොලිත වාර්තාව මෙම ප්‍රකාශනය ජාත්‍යන්තර පර්යේෂණ සඟරාවක් වන පුරාවිද්‍යාව පිළිබද විද්‍යාව 11 වන කලාපයේ ප්‍රකාශ කොට ඇත. (2017)

දකුණු ඉන්දියවේ අක්ක්‍රම්පක්ක්‍රම් ස්ථානයේ සිදුකරන ලද කැණීම් වාර්තාව මෙම වාර්තාව ජාත්‍යන්තර සඟරාවක් වන පුරාවිද්‍යා වේ විද්‍යාව 14වන කලාපයේ ප්‍රකාශ කොට ඇත.(2017)

ජාත්‍යන්තර විද්‍යා සඟරාවක් වන ඉතිහාසිය පුරාවිද්‍යාව සහ මානව වංශ විද්‍යාවේ 17 වන කලාපයේ 11 වන කාණ්ඩය යටතේ ප්‍රකාශනය කර ඇති පාහියන්ලෙන කැණීම් වලින් ලැබුණු ක්ෂුද්‍ර සිලිකාමය පොසිල විශ්ලේෂන වාර්තාව

චාතුර්තක භූගර්භ විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රකාශනයේ ප්‍රසිද්ධියට පත්කර ඇති මානව වංශ විද්‍යාව හා පුරාණ වාක්ෂලතා දී පිළිබඳ ඉපැරණි වාර්තාව මේ වාර්තාව තුළ අන්තර්ගතව ඇත්තේ දකුණු ඉන්දියාවේ අක්ක්‍රම්පක්ක්‍රම් නම් ස්ථානයේ කැණීම් භූමියේ සිදුකරන ලද පර්යේෂණ වල ප්‍රතිඵලයි.

**ජාත්‍යන්තර සම්මාන**

**ආචාර්ය ටී.ආර් ප්‍රේමතිලක**

1. එංගලන්තයේ ස්ථාපනය කොට ඇති පාරිසරික පුරාවිද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය මඟින් 3 අවුරුද්දක් සඳහා වලංගුවන ආකාරයෙන් ලබාදුන් ත්‍යාගය මෙම ත්‍යාගය යටතේ එම සංවිධානය මඟින් ප්‍රකාශනය කරුණු ලබන පාරිසරික පුරාවිද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර ප්‍රකාශනයේ සෑම කාර්තුවක් සඳහාම නොමිලයේ ලබාගැනීමට අවස්ථාව ලබාදී ඇත. මේ යටතේ එක් වසරක් සඳහා ජාත්‍යන්තර ඉහළ ගණයේ ලිපි 25කට වඩා වැඩි ප්‍රමාණයක් නිදහසේ භාවිතා කිරීමට ඇති ඉඩකඩ වැඩිදියුණු කරන ලදී.

2. ඉන්දියාවේ පොන්ඩිචරි මධ්‍යස්ථානය මඟින් මාස 3ක් සඳහා ලබා දෙන ලද අධිශිෂ්‍යත්වය මේ යටතේ පොන්ඩිචරි පර්යේෂණ මධ්‍යස්ථානය සමග ඒකාබද්ධව දකුණු ආසියාව සඳහා වැදගත්වන පෞරාණික පරිසර විශ්ලේෂණය කිරීම සම්බන්ධ පර්යේෂණ කටයුතු කිරීම සිදුකරන ලදී.

3. ජාත්‍යන්තර පර්යේෂණ සඟරාවක් වන PLo S1 සඳහා ඉදිරිපත් වන පර්යේෂන ලිපි පරීක්ෂා කිරීම සඳහා අනුමත මණ්ඩලය නියෝජනය කිරීමට ආරාධනා ලැබීම

**ඇ) විදේශ විශ්වවිද්‍යාල සමඟ සම්බන්ධ වී අධ්‍යාපන සහයෝගීතා වර්ධනය කරමින් පහසුකම් සැලැස්වීම**

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව**

- කැලණිය විශ්වවිද්‍යාලයේ මග පෙන්වීම යටතේ එහි එහි ශාස්ත්‍රිය අංශය සංවිධානය කරන ලද වැඩසටහනක් සඳහා ඉදිරිපත් කරන ලද ශාස්ත්‍රීය සාකච්ඡාව තුලින් ලබාදෙන ලද දායකත්වය

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරි**

- එංගලන්තයේ Univesity Collage of London හී පර්යේෂණ කණ්ඩායමක් සමග පර්යේෂණ ආරම්භ කිරීම සඳහා කරන ලද සාකච්ඡාව

**ආචාර්ය ටී. ආර් ප්‍රේමතිලක**

පහත සඳහන් ආයතන සමග පර්යේෂණ සහයෝගීතා වර්ධනය කොට අඛණ්ඩ ව ඉදිරියට ගෙනයනු ලැබේ.

1.ඉන්දියාවේ ශර්මා ආයතනය සහ උරුම කළමනාකරණ

2.ඉන්දියාවේ පොන්ඩිචර් පර්යේෂණ ආයතනයේ

3.ඉන්දියාවේ පොන්ඩිචරි විශ්වවිද්‍යාලයේ ඉතිහාසය සහ පුරාවිද්‍යා පිළිබඳ අධ්‍යයන අංශය

4. විශ්වවිද්‍යාල සඳහා ඉගැන්වීමේ කටයුතු හා පර්යේෂණ

**ආචාර්ය අර්ජුන තන්තිලගේ**

දේශිය විශ්වවිද්‍යාල හා විදේශිය විශ්වවිද්‍යාල සමඟ සිදුකල සහයෝගීතා පර්යේෂණ

1. ව්‍යාපෘති සම්බන්ධීකාරක - World Atlas of Maritime Buddhism International Project

2. නව දකුණු වේල්සය, ඕස්ට්‍රේලියාව හා ශ්‍රි ලංකාවේ පුරාවිද්‍යා පශ්චාත 'උපාධි ආයතනය සමඟ එක්ව සිදුකරන සහයෝගීතා ව්‍යාපෘතියකි. මේ සඳහා මූල්‍යමය අනුග්‍රහය ඕස්ට්‍රේලියානු පර්යේෂණ කවුන්සිලය මගින් ප්‍රදානය කොට ඇත

3. පොළොන්නරුව පුරාවිද්‍යාත්මක පර්යේෂණ ව්‍යාපෘතියේ ක්ෂේත්‍ර විශේෂඥ

**ආචාර්ය ඩී.පී.ගම්ලත්**

මහාචාර්ය ඒ.ඒ.ඩී.අමරසේකර මහතා වෙනුවෙන් සම්පාදනය කරන ලද ශාස්ත්‍රීය ප්‍රකාශනය සකස් කිරීම සඳහා කැලණිය විශ්වවිද්‍යාලය සමග සහයෝගයෙන්

**ඉ)මහජන සුභසිද්ධීන් වෙනුවෙන් කරන ලද දායකත්වය**

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව මහතා**

i. සංස්කෘතික අමාත්‍යංශයේ Sinhala Encyclopedia Project හි උපදේශන කමිටුවේ සමාජිකයෙකි

**ආචර්ය ටී.ආර්.ප්‍රේමතිලක මහතා**

i. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නියමිත දේශන හා ඉගැන්වීමේ කටයුතුවලට අමතරව කොළඹ විශ්වවිද්‍යාලයේ අණුක ජීව විද්‍යාව සහ වෛද්‍ය පර්යේෂණ ආයතනය සමග සම්බන්ධ වී එහි ඉගෙනුම ලබන ශිෂ්‍යයින් දෙදෙනෙකු සඳහා පර්යේෂණ ව්‍යාපෘතිවලට අවශ්‍යය උපදෙස් හා ඉගැන්වීමේ කටයුතු සිදුකිරිම

**ආචාර්ය රෝස් සෝලංගාරච්චි**

i.පුරාවිද්‍යා ක්ෂේත්‍රයේ සේවය නියුක්තිකයන් සඳහා යෝජිත සේවා ව්‍යවස්ථාව සම්පාදන කමිටුව සඳහා, ශ්‍රී ලංකා පුරාවිද්‍යාඥයින්ගේ සභාව නියෝජනය කරමින් කටයුතු කිරීම.

ii. පුරාවිද්‍යාඥයන්ගේ සභාවේ පනත සංශෝධනයට අවශ්‍ය අධියර 3කින් යුතු උපාධි පාඨමාලාව හඳුන්වාදීම සඳහා වූ අධ්‍යයන කමිටුවේ සභාපති ලෙස කටයුතු කිරීම. (අදියර I- පුරාවිද්‍යා සහතිකලාභී, අධියර II- පුරාවිද්‍යාඥ, අධියර III – වරලත් පුරාවිද්‍යාඥ)

iii. ජාතික අවශ්‍යතාවයක් සඳහා ඉටු කරන්නාවූ සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය පූර්ව තත්ව වාර්තාවන් ලබා දීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද, එහි ලියාපදිංචි සමාගමක දායකත්වය ලබා දීම. වෘත්තීමය පුරාවිද්‍යාඥයන්ගෙන් සහ උපාධිධාරීන්ගෙන් සමන්විත මෙම යෝජිත සංවර්ධන ව්‍යාපෘති මගින් බලපෑමක් සිදුවන ප්‍රදේශයේ තිබෙන්නා වූ පුරාවිද්‍යාත්මක සම්පත් පිළිබඳ සම්පූර්ණ චිත්‍රයක් ලබා දීම සිදු කරයි.

iv පුරාවිද්‍යා හා ඉතිහාසය පිළිබඳ ඉගැන්වීම් කරන්නන්ගෙන් සැඳුම් ලත් ජාත්‍යන්තර සම්මේලනයේ විධායක සභාවෙහි සාමාජිකයකු ලෙස කටයුතු කිරීම ඃIFTAH).

**ආචාර්ය අර්ජුන තන්තිලගේ**

i.මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් ස්ථාපිත සීගිරිය කැටපත් පවුර සංරක්ෂණය පිළිබඳ විද්වත් මණ්ඩලයේ සාමාජික හා සීගිරිය කැඩපත්පවුර්ර් සංරක්ෂණ කටයුතු නිරීක්ෂණය කිරීම හා අධීක්ෂණය මේ සම්බන්ධ ව ගරු අමාත්‍ය අකිල විරාජ් කාරියවසම් (සංස්කෘතික හා අධ්‍යාපන අමාත්‍යංශය) හා මහාචාර්ය ප්‍රශාන්ත ගුණවර්ධන (අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම සංස්කෘතික අරමුදල) ඇතුළු විද්වත් මණ්ඩලය සමඟ පැවැත්වූ වශේෂ සාකච්ඡා සඳහා සහභාගී වීම

ii.මධ්‍යම සංස්කෘතික අරමුදල යටතේ ක්‍රියාත්මක ත්‍රිකුණාමලය ව්‍යාපෘතියෙහි පුරාවිද්‍යා අධ්‍යක්ෂ ලෙෂ කටයුතු කිරීම (වර්තමානයේ ත්‍රිකුණාමලය ලන්දේසී කොටුව වැදගත් සංචාරක මධ්‍යස්ථානයක් වහයෙන් ප්‍රවර්ධනය කිරීමේ වැඩකටයුතුවල නිරත වී සිටී)

**(ඊ) ජාතික අධ්‍යාපන ආයතනය / මධ්‍යම සංස්කෘතික අරමුදල සමග සහයෝගීතා**

**ආචාර්ය අර්ජුන තන්තිලගේ**

i මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවකයින් පුහුණු කිරීම ( බිතුසිතුවම් සංරක්ෂණය සම්බන්ධ සහතික පත් පාඨමාලාව)
ii පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුන් සහ අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා විද්‍යාගාර සේවාව සැපයීම
iii විද්‍යාගාර සේවය බාහිර සේවාදායකයන් වෙත ලබාදීම
iv සංස්කෘතික ද්‍රව්‍ය විශ්ලේෂණ විද්‍යාගාරයේ පුහුණුව සඳහා අවස්ථාව සැපයීම
**v** මධ්‍යම සංස්කෘතික අරමුදල හා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සමග පර්යේෂණ වැඩ සඳහා සහභාගි වීම

**ආචාර්ය ඩී.පී.ගම්ලත් මහතා**

**i** මධ්‍යම සංස්කෘති අරමුදලේ අම්පාර ව්‍යාපෘතියේ පුරාවිද්‍යා අධ්‍යක්ෂ වශයෙන් එහි පුරාවිද්‍යා ගවේෂණ සහ කැණීම් අධීක්ෂණය කිරීම

ii ICOMOS ආයතනය මගින් මෙහෙයවනු ලබන මාසික දේශනය සඳහා 2017 පෙබරවාරි මස ශ්‍රී ලංකාවේ බුද්ධ ප්‍රතිමා ගෘහ සහ අවකාශීය සංවිධානය යන මැයෙන් ශාස්ත්‍රිය දේහනයක් පැවැත්වීම

ජේතවන ස්තූපයේ වාස්තු විද්‍යා මූලිකාංග සහ ඉදිකිරීමේ තාක්‍ෂණික ක්‍රම කෘතියට 2017 වර්ෂය සඳහා හොඳම බෞද්ධ පර්යේෂණ ග්‍රන්ථයට හිමි සම්මානය සමස්ත ලංකා බෞද්ධ මහාසම්මේලනයෙන් පිරිනමන ලදී.

**එන්. නන්කඳුර මහතා -කථිකාචාර්ය**

**ජාතික අධ්‍යාපන ආයතනය** (NIE)
i. 11, 12 සහ 13 වසර චිත්‍ර කලාව ගුරු අත්පොත් සංස්කරණය
ii. 11, 12 වසර චිත්‍ර කලාව සඳහා අතිරේක කියවීම් පොත සංස්කරණය
ii. 13 න් වසරක අඛණ්ඩ අධ්‍යාපනය" වැඩසටහන සඳහා සම්පත් දායකත්වය හා සංස්කරණය

**පුහුණු පාඨමාලා**
i. කලා ඉතිහාසය සහතික පත්‍ර පාඨමාලාව සම්බන්ධීකරණය.
ii.බිතු සිතුවම් සංරක්‍ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සම්බන්ධීකරණය.

**උ) මහජනතා දැනුවත් කිරීම් වැඩසටහන්**
**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය රාජ් සෝමදේව**

i.අම්පාර දිස්ත්‍රික්කයේ වෛද්‍යවරුන් සඳහා ලබාදෙන ලද දේශන වැඩසටහන

ii.මාතර දිස්ත්‍රික්කයේ වෛද්‍යවරුන් සඳහා ලබාදෙන ලද දේශන

iii.මිලාගිරිය ශාන්ත පාවුළු විදුහල සඳහා ලබාදෙන ලද දේශන

iv ශාන්ත තෝමස් විද්‍යාලයේ ඉතිහාසය තුරවරු සඳහා ලබාදෙන ලද දේශනය

v ඇඹිලිපිටිය දිස්ත්‍රික ලේකම් කරේයාලයේ කාර්ය මණ්ඩල සඳහා දේශන

vi කොළඹ විශාඛා විද්‍යාලය සඳහා ලබාදෙන ලද දේශනය

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ගාමිණී අධිකාරි**

i. Change and continuity of Chinese Sri Lankan Relationship: An Archaeological perspective- International Confucian forum - Scheme of International seminar in Colombo 2017

ii. ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමේදී පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ දායකත්වය - ආරාධිත දේශනය, පොළොන්නරුව ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල

iii. පුරාජෛවවිවිධත්ව සංරක්ෂණය හා ආරක්ෂණය - දැනුවත් කිරීමේ වැඩමුළුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

iv. සාමුද්‍රිය පුරාජෛවවිවිධත්ව පර්යේෂණ (ආචාර්ය ඩබ්. බෝහිංගමුව මහතා වෙනුවට) - දැනුවත් කිරීමේ වැඩමුළුව, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

v. 'ආරාධිත අමුත්තා', ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන (2017 ජුනි 20 - පෙ.ව. 9-12)

vi. 'පොසොන් පොහාය උදාව මිහිඳු හිමි දවස හා අද පරිසරය', ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන (2017 ජුනි 06)

vii. 'ප්‍රභාගිර' වැඩසටහන, 'ප්‍රාග් මහින්ද යුගයේ අනුරාධපුරය' ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ වැඩසටහන (2017 ජුනි 07)

**ආචාර්ය ටී.ආර්.ප්‍රේමතිලක**

i.මුතුරාජවෙල ප්‍රදේශයේ සිදුකරන ලද පර්යේෂණ ව්‍යාපෘතිය මේ යටතේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා ශිෂ්‍ය කණ්ඩායම සහ මුතුරාජවල තදාසන්න පද්ධතියේ ජනතාව සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම

ii. ශ්‍රි ලංකා ගුවන්විදුලි සංස්ථාව මගින් විකාශනය කරනු ලැබෙන අඛණ්ඩ වැඩසටහන් තුළ අති පුරාණ පරිසර වෙනස්වීම සහ මානව ක්‍රියාකාරිත්වය පිළිබඳව වැඩසටහන් විකාශනය කිරීම මේ යටතේ අපොස.සා.පෙළ සහ උ.පෙළ සිසුන්ට ප්‍රයෝජනවත් වන ඉතිහාසය සහ පුරාවිද්‍යාව තේරුම් ගැනීම පිළිබඳ වැඩසටහන් ඉදිරිපත් කරන ලදී.

**රංජිත් බණ්ඩාර -කථිකාචාර්ය**

I පාසැල් ඉතිහාස විෂය ධාරා සම්බන්ධ වූ ගුරුවරුන්ගේ පුහුණු වැඩමුළුවක් පැවැත්වීම, සංවිධායකත්වය දඹුල්ල ව්‍යාපෘතිය, මධ්‍යම සංස්කෘතික අරමුදල , අධ්‍යාපන අමාත්‍යංශය

ii පූර්ව ඉතිහාසය සම්බන්ධ වූ නව සොයාගැනීම් පිළිබඳප්‍රසිද්ධ දේශනයක් පැවැත්වීම, සංවිධායකත්වය පොළොන්නරුව කෞතුකාගාරය, මධ්‍යම සංස්කෘතික අරමුදල , අධ්‍යාපන අමාත්‍යංශය

iii සීගිරිය මධ්‍යම සංස්කෘතික අරමුදල ඇතිව දඹුල්ල ප්‍රදේශයේ පාසල් සහ කළුතර මතුගම ප්‍රදේශයේ පාසල් වල ඉතිහාසය උගන්වන ගුරුවරුන් සඳහා ඉදිරිපත් කරන ලද දේශන

**එන් .නන්කඳුර- කථිකාචාර්ය**

i. "පුනරුද කලාව" ප්‍රසිද්ධ දේශනය, සංවිධානය මධ්‍යම සංස්කෘතික අරමුදල, දඹුල්ල ව්‍යාපෘති කාර්යාලය.

ii. "පෙරටුගාමී කලාව" ප්‍රසිද්ධ දේශනය, සංවිධානය තීර්ත කලා කරුවන්ගේ එකතුව.

**ඌ) මධ්‍යම සංස්කෘතික අරමුදල, ජාතික කෞතුකාගාරය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව පිරිනමන ලද සංනා්‍යාමික ශිෂ්‍යත්ව සංඛ්‍යාව**

| | 2014/2015 | **2015/2016** | **2016/2017** | 2017/2018 |
|---|---|---|---|---|
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 06 | 09 | 38 | 15 |
| ශාස්ත්‍රපති | - | 01 | - | 01 |
| විද්‍යාපති | 04 | 08 | 03 | 01 |
| දර්ශනපති | - | 01 | - | - |
| **මුළු එකතුව** | **10** | **19** | **41** | **17** |

**එ). පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සිදු කළ ප්‍රකාශන**

| **කතෘවරු** | **ලිපිය** | **ප්‍රකාශක** | **ප්‍රකාශනයේ / සඟරාවේ නම** |
|---|---|---|---|
| ආර්. සෝමදේව<br>ආර්.ඒ.වන්නිනායක<br>ඩී.දේවගේ 2017 | බුද්ධ රශ්මි වෙසක් කලාප | මධ්‍යම සංස්කෘතික අරමුදල | ජාතික වෙසක් ප්‍රකාශන 2017 |
| සෝමදේව ආර්<br>ආර්.ඒ.වන්නිනායක<br>ඩී.දේවගේ<br>ජේ.අම්බලන්පිටිය | Clay working and Basketry: new materiality of Hunter-gather/Foragers in mid/late Holocene Sri lanka | රජරට විශ්වවිද්‍යාලය | පුරාවිද්‍යා සහ උරුම කළමනාකරන ප්‍රකාශන 2017 |
| සෝමදේව ආර්<br>ආර්.ඒ.වන්නිනායක<br>ඩී.දේවගේ<br>ජේ.අම්බලන්පිටිය | Cultural Dynamism of prehistoric Hunter | උප්සලා විශ්වවිද්‍යාලය | Paul Sinclair සැමරුම 2017 |

| | | | |
|---|---|---|---|
| ජී. අධිකාරි | An Odontological Analysis of Prehistoric Human remains found in a Shell midden at Pallemalala Southern Sri Lanka.<br><br>Animal bone remains found at Welmalkema rock pool, Yala Block 1<br><br>The Buddhist Monasteries and Ancient Medical practices in Sri Lanka"an overview<br><br>කලාව ගැන කලාව සහ සුදත් රෝහණ<br><br>ශ්‍රී ලංකාවේ පුරාණ වෛද්‍ය විද්‍යාව සහ සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රියාවලිය | Sri Lanka Association<br><br>Department of Wildlife Conservation, Sri Lanka<br><br>Central Cultural Fund<br><br>සත්ජන සහෘද සංසදය<br><br>ජාතික විද්‍යා පදනම | Conference manual, Annual Scientific Session, 23rd & 24th June 2017, 23 pp<br><br>Proceeding of the Annual Session, Wildlanka, International Symposium 2017, 15th – 16th August, 2017<br><br>Buddha Rashmi Vesak volume: Essas in Buddhism and Buddhism and Buddhist monastic Archaeology, 2017<br><br>දශකත්‍රයක සුදත් රෝහණ නිර්මාණාලංකාරයඃ විමසුම් ලිපි සරණිය, සත්ජන සහෘද සංසදය<br><br>'විදුරාව' ජාතික විද්‍යා පදනමේ විද්‍යා සඟරාව, ජාතික විද්‍යා පදනම |
| රොස් සෝලංගආරච්චි | සීගිරිය ජල තාක්ෂණය | කොළඹ නෙප්චූන් ප්‍රකාශකයෝ | 2017 ISBN : 978-955-7496-29-0 |
| ප්‍රේමතිලක සහ ඔහුගේ කණ්ඩායම | දකුණු ඉන්දියාවේ පොරුන්දල් නම් වූ පුරාවිද්‍යාත්මක ස්ථානයේ හමුවන පයිටොලිත් වල සංකීර්ණතාව | එල් සිවියර් | පුරාවිද්‍යාවේ විද්‍යාව |

| | | | |
|---|---|---|---|
| ප්‍රේමතිලක සහ ඔහුගේ කණ්ඩායම | දකුණු ඉන්දියාවේ අක්කුම්පක්කුම් නම් වූ අති පුරාණ කැණීම් භූමියේ මතුවුනු පයිටොලිත වාර්තාව | එල් සිවියර් | පුරාවිද්‍යාවේ විද්‍යාව |
| ප්‍රේමතිලක සහ ඔහුගේ කණ්ඩායම | ප්ලයිස්ටොසීන කාලයේ පැවති වෘක්ෂලතා ආදිය සහ මානව තත්ව පිළිබඳ පර්යේෂණ වාර්තාව | එල් සිවියර් | චාතුර්තක භූගර්භවිද්‍යාව |
| ප්‍රේමතිලක සහ ඔහුගේ කණ්ඩායම විසින් භාවිතා කරන ලද වී වර්ග පිළිබඳ පොසිල පයිටොලිත වාර්තාව | පාහියන්ලෙන ප්‍රාග් ඓතිහාසික ගල්ගුහාවෙන් හමුවූ අති පුරාණ ප්ලයිට්ටෝසීන මානව සංස්කෘතිය | විශ්ව ලේඛන ආයතනය | ඉතිහාස පුරාවිද්‍යා සහ මානව වංශ විද්‍යාව |
| ප්‍රේමතිලක සහ ඔහුගේ කණ්ඩායම | මැලේසියාවේ නියාකේව් වල සිදුකරන ලද කැණීම් වාර්තාව ඇසුරෙන් ලියාඇති ප්‍රකාශනය මෙම ප්‍රකාශනය ග්‍රීන් බාකර් සහ ලුසීපා යන විද්වතුන්ගේ සංස්කරණය මගින් ඉදිරිපත් කොට ඇති ග්‍රන්ථය සඳහා ලියා ඇති ලිපියකි. | සර්වක් කෞතුකාගාර ය සහ එංගලන්තයේ මැක්ඩොලන් ඩ් ආයතනය | ෂර්වක් රාජ්‍යයේ නියාකේව් ගල්ගුහාවේ පුරාවිද්‍යාත්මක පර්යේෂණ |
| ප්‍රේමතිලක සහ ඔහුගේ කණ්ඩායම | පරාග පයිටොලිත ඩයටම සහ ලී කොටස් පිළිබඳ පෞරාණික පරිසර තත්ව විශ්ලේෂන කිරීමක් | සර්වක් කෞතුකාගාර ය සහ එංගලන්තයේ මැක්ඩොලන් ඩ් ආයතනය | ෂර්වක් රාජ්‍යයේ නියාකේව් ගල්ගුහාවේ පුරාවිද්‍යාත්මක පර්යේෂණ |
| ප්‍රේමතිලක සහ ඔහුගේ කණ්ඩායම | පරාග සහ ඒවායේ විවිධ තත්ව සමඟ පයිටොලිත විශ්ලේෂණය පිළිබඳ වාර්තා සහ සම්බන්ධ අමතර කරුණු සහ ඊට අදාල තත්ව පිළිබඳ පූර්ණ සටහන | සර්වක් කෞතුකාගාර ය සහ එංගලන්තයේ මැක්ඩොලන් ඩ් ආයතනය | ෂර්වක් රාජ්‍යයේ නියාකේව් ගල්ගුහාවේ පුරාවිද්‍යාත්මක පර්යේෂණ |

| | | | |
|---|---|---|---|
| ඒ. තන්තිලගේ | Red Pigments Used in Kandy Period MuralsLaboratory of Cultural Material Analysis<br><br>කෙවුල්ගම දළදාගමන් මාළිගා විහාරස්ථානයේ පුස්කොළලේඛණය<br><br>උඩරට බිතුසිතුවම් කලාවේ නීල වර්ණයෘ දේශපාලනහා ආර්ථික පෙරළියක ප්‍රකාශනයක් ලෙස<br><br>An Evaluation on Scientific Investigation of Bronze Tara Image from Sri Lanka at the British Museum: A Critical Controversy of its Provenance, in *Buddha Rashmi*, | PGIAR<br><br>PGIAR<br><br>PGIAR<br><br>Central Cultural Fund, Colombo. | Publication Series \| 05Memoirs of the Postgraduate Institute of Archaeology 2017/01<br><br>Memoirs of the Postgraduate Institute of Archaeology 2017 /2<br><br>Memoirs of the Postgraduate Institute of Archaeology 2017 /3<br><br>*Vesak Volume* |
| රංජිත් බණ්ඩාර මහතා | Petroforms: Stone Circles,Boulder Rectangles and Caim Fearures discovered at Yan Oya Middle basin(article) | University of Rajarata | ProtoHistoric Archaeology in Sri Lanka special Volume |
| ආචාර්ය ඩී.පී. ගම්ලත් | රෝහණ රාජධානියේ බෞද්ධ සංඝාරාම පිළිබඳ ශාස්ත්‍රීය ලිපියක් ලබාදීම | | පුරාවිද්‍යා මහාචාර්ය ඒ. ඩී. අමරසේකරමහතා වෙනුවෙන් සකස්කර ගෙන යනු ලබන උපහාර කළඹට |
| එන්.ආර්.පී. නන්කඳුර<br>**සම කර්තෘ** | , 2017, *මහනුවර සම්ප්‍රදායේ නිල් වර්ණය දේශපාලනික කේතයක් ලෙසට*,<br><br>ගුරු අත්පොත සකස් කිරීම | පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය.<br><br>ජාතික අධ්‍යාපන ආයතනය | 2017 |

## 18. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ඇතුළාන්තය

### 18.1 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අගයන්

පුරාවිද්‍යාවේ හා ඊට අදාළ විෂයයන් පිළිබඳ පු.වි.ප.උ ආයතනය මඟින් නවෝද්පාදන හා සමාජ වගකීම උසස් තත්වයකින් පෝෂණය කිරීම සිදු කරනු ලැබේ. එහි අගයන්ට පහත සඳහන් දෑ ඇතුළත්ව ඇත.

- කුසලතා මත අති උත්කෘෂ්ඨවත්වයට හා ප්‍රගතියට කැපවීම
- සාධාරණත්වය හා සමානාත්මතාවය
- විවිධත්වය
- අන්තර්ගත භාවය
- කෙටි හැඳින්වීමක්
- විවෘතතාවය
- ජනවාර්ගිකව පිළිගත හැකි හැසිරීම්
- නවෝත්පාදනය හා නිර්මාණය පෝෂණය කිරීම
- නායකත්ව සංවර්ධනය
- පාරිසරික යහපැවැත්ම

### 18.2 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මාර්ගෝපදේශ මූලධර්ම

පු.වි.ප.උ. ආයතනය සදාචාරාත්මක ලෙසත් සාධරණ ලෙසත් පාරිසරික සමතුලිතතාවයෙන්ද කටයුතුවල නිරතවන අතර විශේෂයෙන් අප විසින්;

නීතියෙන් පවතින අභියෝගතා හා වාද විවාද තුළින් අධ්‍යාපන නිදහස ක්‍රියාත්මක කිරීම ගරුකරමින් ප්‍රවර්ධනය කිරීම.

- ශිෂ්‍යයන්ගේ සමාජීය, ආර්ථික, ජනවාර්ගික ආගමික හෝ වෙනයම් පසුතල පිළිබඳව නොසලකා පු.වි.ප.උ ආයතනයේ අධ්‍යාපනයන් ප්‍රතිලාභ ලබාදෙමින් ඊට දායකත්වය ලබා දෙමින් අධ්‍යපන කුසලතා හා පදනම් කර ගනිමින් ශිෂ්‍යයන් වෙත ස්ථාන ලබා දීම. පු.වි.ප.උ ආයතනයට බඳවා ගැනීම මුදල් දී හෝ පෙළඹවීමකින් හෝ බලපෑමකින් ලබා නොදෙනු අතර ස්ථාන විනිවිද තරගකාරී ක්‍රියාවලියකින් පමණක් සිදු කරනු ලැබේ.

- පැහැදිලි නිර්ණයක තුළ සාධාරණ ක්‍රියාවලියක් තුළින් සම්පූර්ණ වශයෙන්ම ශිෂයන්ගේ කාර්ය සාධනය ඇගයීමකට ලක් කොට උපාධි හා සුදුසුකම් ලබා දෙනු ලැබේ.

- සේවක මණ්ඩලයේ සියල්ලන්ගේම කුසලතා හා හැකියාවන් වර්ධනය කරමින්, කැපී පෙනෙන කාර්ය සාධනය සඳහාත් ප්‍රවර්ධනය කොට උපහාර දක්වමින් සමාන අවස්ථා තහවුරු කරමින් උසස් තත්වයේ අධ්‍යයන නායකත්වය විද්‍යාලයීය පොදු වගකීම් සහ පොදු වෘත්තීමය කළමණාකාරීත්වය ප්‍රවර්ධනය කොට ඒ සඳහා සහයෝගය දක්වමින් පිළිගත නොහැකි හැසිරීම් අභියෝගයට ලක් කරමින් සදාචාරය හා ප්‍රසම්පාදන පරිචයන් යොදා ගැනීම තුළින් සාධාරණ හා සම්භාවනීය තේමාදායකයෙකු වීම.

- ශ්‍රී ලාංකික පුරවැසියන් දියුණු තත්වයකට පත්කරමින් මානව අයිතීන් සඳහා ගරුකරමින්, අවිද්‍යාව, දුගී බව, දුර්වල සෞඛ්‍යතත්වයන් හා දේශපාලනික කුරිරුකම් සඳහා විරෝධතාව දක්වමින් පු.වි.ප.උ. ආයතනය හි අධ්‍යයන හා පර්යේෂණ බලපෑම කෙරෙහි යොමුවීම

- මූලාරම්භයේ සිටම තදින්ම ආගමිකව සම්බන්ධ නොවූ ආයතනයක් වශයෙන් නිදහසේ සිතීම හා හෘද සාක්ෂියට ගරු කිරීම,එහෙත් කාලයක් තිස්සේ කෙරෙන අවිචාරමත් පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීම.

- විශ්වවිද්‍යාලය තුළවිවිධ කණ්ඩායම් අතර ආගමට, දේශපාලනයට, ලිංගිකත්වයට, නොහැකියාවට, වයසට, ජනවාර්ගිකත්වයට හා කාමසක්ත බවට සංවාද තුළින් ඉවසීමේ හැකියාව වර්ධනය කිරීම මත ධනාත්මක හා විවෘත සබඳතාවයක් අත්කර ගැනීම.

- කොළඹ ඇතුළත සේවක මණ්ඩලය හා ශිෂ්‍යයින් විසින් පාසැල් හා වෙනත් මහජන ප්‍රජා ආයතන සමග සබඳතා ගොඩනගා ගනිමින් ඉතා උසස් මට්ටමේ වත්කමක් පවත්වාගෙන යාම.

- සුරක්ෂිත ආකර්ෂනීය ආයතනයක් පවත්වාගෙන යාම.

## 18.3 ආයතනයේ කාර්‍ය සාධනය උසස් කරලීම සඳහා යෝජිත කෙටිකාලීන හා මධ්‍යකාලීන පියවර පිළිබඳ මිණුම් සාරාංශයකි.

18.1 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පශ්චාත් උපාධි ආයතනයේ විශේෂිත අවශ්‍යතාවන්ට සරිලන සම්පූර්ණ කළමණාකාරීත්ව පද්ධතීන් දැනට පිළියෙල කොට ඇති අතර අත් පොතක් ද ඉදිරිපත් කොට ඇත.

18.2. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන පීඨය විසින් පර්යේෂණ ප්‍රකාශ සැහෙන සංඛ්‍යාවක් ඉදිරිපත් කොට ඇති අතර පීඨයේ සෑම සමාජිකයෙකුම දැනට ක්ෂෙත්‍ර පර්යේෂණ කටයුතු වල නිරතව ඇත.

18.3. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් අධ්‍යයන වර්ෂයම සැලසුම් කොට පූර්වයෙන් උපලේඛන ගත කර තිබූ සියළුම අනිවාර්ය ඉසව් ඇතුළත් කොට ශක්තිමත් අධ්‍යයන කාලසටහනක් ඉදිරිපත් කිරීමට හැකිවී ඇත.

18.4. පශ්චාත් උපාධි ආයතනයට විභාග ප්‍රතිඵල තුලනාත්මකව වැඩි ප්‍රමාදයකින් තොරව නිකුත් කිරීමට හැකියාව ලැබී ඇත.

18.5. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් එහි විභාග නිර්දේශ පත්‍ර සංශෝධනයකොට උසස් උපාධි වැඩසටහන් හඳුන්වා දීමට හැකි වී ඇත.

18.6. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහිම නව සම්ප්‍රදායයන් බිහි කොට ශිෂ්‍යයන් අතර අධ්‍යාපන තරඟකාරීත්වය ප්‍රවර්ධනය කිරීම වස් ඔවුනොවුන් අතර හා පු.වි.ප.උ. ආයතන සේවක මණ්ඩලය අතර ප්‍රජා හැඟීම් ඇති කිරීම සඳහා සම්මාන ප්‍රදානයක් පිරිනැමීමේ උත්සවයක් ආරම්භ කර ඇත.

18.7. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පුරාවිද්‍යාව හා සම්බන්ධිත විෂයයන් දියුණු කිරීම සඳහා අනුපමය සේවාවක් ඉටු කරනු ලබන පුද්ගලයින් හා ආයතනය වෙත ප්‍රසිද්ධියක් ලබාදෙන පුද්ගලයන් හැඳින ගැනීමේක්‍රමයක් ආරම්භ කොට ඇත. මෙම සම්මාන පිරිනැමීමේ ක්‍රමයට (PGIAR BRICK AWARD) "පු.වි.ප.උ. ආයතනයේ බ්‍රික් සම්මානය" වශයෙන් හඳුන්වනු ලැබේ.

18.8. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පුස්තකාලයට සාමාජිකයන් බඳවා ගැනීමේ ක්‍රමයක් සකස් කර දීමට හැකි වී ඇති අතර මෙමඟින් පීඨය විසින් පාවිච්චියට ගනු ලබන පොත්පත් විශේෂිතාවයන් තුළ ආපසු බාර දීමට හැකිවීමටත් පුස්තකාල ආරක්‍ෂාව වැඩි දියුණු කිරීමටත් පුස්තකාල අත්පොතක් නිර්මාණය කිරීමට හැකි වී ඇත.

18.9. මධ්‍යම සංස්කෘතික අරමුදලේ කාර්යයන් කෙරෙහි පු.වි.ප.උ. ආයතන පීඨය වඩාත් මැදිහත් වීමත් සිදු කළ අතර රජයේ ආයතනවල උරුමය හා පුරාවිද්‍යාව පිළිබඳ ගැටළු නිරාකරණය කිරීමේ ව්‍යාපෘතිවලට සහභාගී විය.

18.10. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රසිද්ධ දේශන වැඩසටහන් හා මූලික පදනම් පාඨමාලාවෙන් එහි දැක්ම අර්ධ වශයෙන් සාක්ෂාත් කර ගැනීමට හැකියාවන් ලැබී ඇත.

## 18.4 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන විශේෂයන කිරීම්

රට තුළ ඇති සියලුම විශ්වවිද්‍යාල පද්ධති සඳහාත් හා පුරාවිද්‍යාව හා සම්බන්ධ වෙනත් ආයතන සඳහාත් පු.වි.ප.උ. ආයතනය වෙත පහත සඳහන් පහසුකම් ඇත.

සිතියම් ගත කිරීම් සහ කෙටුම්පත් කිරීම්
ප්‍රකාශනය හා තොරතුරු
සංස්කෘතික ද්‍රව්‍ය විශ්ලේෂණ විද්‍යාගාරය (LCMA)

## 18.5 පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන වෙසෙසියා ඒකකය

වෙසෙසියාන අතරින් සිය ගමන් මග තෝරාගත හැකි පහත වෙසෙයියාන සඳහන් සිසුන්, පුරාවිද්‍යා අධ්‍යයනය දිගටම කරගෙන යාමට කැමැත්තක් දක්වන සිසුන් සඳහා පර්යේෂණ හා පුහුණුකිරීම් සිදු කරනු ලබන අතර එම වෙසෙයියාන අතුරින් සිය ගමන් මග තෝරාගත හැක.

කලා හා උරුමය
සමාජ පුරාවිද්‍යාව
පාරිසරික පුරාවිද්‍යාව
ජීව හා භූගෝලීය පුරාවිද්‍යාව
පෞරාණික ලෝහ විද්‍යාව
ඓතිහාසික භූගෝල විද්‍යාව
ප්‍රාග් ඉතිහාසය හා අස්ථි විද්‍යාව
පුරාවිද්‍යාත්මක විද්‍යාව

## 19. පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය විමර්ශන පුස්තකාලය

